**ශීර්ෂය - 009 - පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය**

1. **මූල්‍ය ප්‍රකාශන**

## 1.1 මතය

ශීර්ෂය 009 - පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 20 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අධිකාරයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූලි 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අධිකාරය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අධිකාරයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු පිළියෙල නොකිරීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයයන් 04 ක සියයට 14 සිට සියයට 100 දක්වා පරාසයක ඉතිරිවීම් පැවතුණි. | අලුතින් කාර්යාල කාර්ය සහායකයින් 03 ක් බඳවා ගැනීම නිසා අතිකාල සේවයේ යෙදවීමේ අවශ්‍යතාවයක් ඇති නොවීම, රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2023 හා 02/2023 මගින් වියදම් කළමනාකරණය කිරිම, රාජකාරි ගමන් සඳහා කාර්යාල වාහනය භාවිත කිරිම සහ සංයුක්ත දීමනා නොගෙවීම, අපේක්ෂිත පරිදි වාහන අලුත්වැඩියා කිරීමට අවශ්‍ය නොවීම හා හිටපු ලේකම් මහතා මාස 3 ½ ක් විදේශ නිවාඩු ලබා ගැනීම හා සේවයෙන් ඉවත්වීම නිසා ප්‍රවාහන දීමනා සඳහා වෙන් කරන ලද මුදල් ගෙවීමේ අවශ්‍යතාවයක් නොවීම නිසා මෙම ඉතිරිවීම් සිදුවිය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. |
| (ආ) | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ නඩත්තු වැය විෂයයේ මූලික ප්‍රතිපාදනය රු.250,000 ක් විය.එම වැය විෂයයට මු.රෙ.66 මගින් රු.200,000 ක් මාරුකරගෙන තිබුණු අතර ඒ හේතුවෙන් එම වැය විෂයයේ රු.36,227 ක් වූ ඉතිරිය සඳහා දක්වා තිබුණු හේතුන් විගණනයේදී පිළිගත නොහැකි විය. | අධිකාරයේ භාවිතා කළ ඡායා පිටපත් යන්ත්‍රයක් සහ වායු සමීකරණ යන්ත්‍රයක් අනපේක්ෂිත පරිදි ක්‍රියාවිරහිතවීම නිසා අලුත්වැඩියා කිරීමට සිදු වූ අතර එම අලුත්වැඩියාව සඳහා 2102 වැය විෂය යටතේ ලබා දී තිබුණ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත මු.රෙ. 66 යටතේ ප්‍රතිපාදන මාරු කර ගැනීමට සිදුවිය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16.2 වගන්තිය | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කළ කාර්යසාධන වාර්තාවේ කෙටුම්පත මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | කාර්යසාධන වාර්තාව භාෂාත්‍රයෙන්ම ඉදිරිපත් කළ යුතුවීම හා මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත වාර්තාව ලබාදිය යුතුවීමත් නිසා සකස් කිරීම ප්‍රමාද විය. කෙසේ වෙතත් විගණන වාර්තාව ලද පසු කාර්ය සාධන වාර්තාව සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. | විගණන පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 2020/02 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 වගන්තිය | අධිකාරය විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | විශාල වශයෙන් මිලදී ගැනීම් සිදු නොකිරීම හා සියලු ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම් රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව මගින් සිදු කිරීමත් නිසා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කිරීම ප්‍රායෝගික නොවන බව සැලකුව මැනවි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) 2023 නොවැම්බර් 30 දිනැති අංක 05/2023 දරණ රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 06 වගන්තිය | (i) 2023 දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරීන්ගේ අත්තිකාම් "බී" ගිණුමට මුදලින් ලැබී තිබුණු රු.663,000 ක් ඒසීඒ 5 ආකෘතියෙහි හරස් සටහන් මගින් ලැබීම් ලෙස සටහන් කර තිබුණි. | මෙය මුදලින් ලද ලැබීමක් නොව වැටුප් ගෙවීමේදී අයකරගන්නා ලද ණය වාරික වේ. එය හරස් සටහන් මඟින් ගිණුම්ගත කිරීම නිවැරදි බව දන්වා සිටිමි. | රු.663,000 ඒසීඒ 5 ආකෘතියෙහි මුදලින් ලැබීම් ලෙස සටහන් කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| (ii)ඒසීඒ 6 ආකෘතිය වෙනුවට සිගාස් වෙබ් යෙදුම මගින් උත්පාදනය කරන ලද මූල්‍ය නොවන වත්කම් වාර්තාව (SA 82)මූල්‍ය ප්‍රකාශනයට අමුණා නොතිබුණි.තවද මූල්‍ය ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය නොවන වත්කම් ලෙස රු.21,014,390 ක ශේෂයක් දක්වා තිබුණද මූල්‍ය නොවන වත්කම් වාර්තාව (SA 82)හිස් වාර්තාවක් විය. | සමහර භාණ්ඩවල වටිනාකම නිවැරදිව තිරණය කළ යුතුවීම සහ ගිණුම් අංශයට එක් නිලධාරියෙකු පමණක් අනුයුක්ත කර ඇති නිසා වත්කම් පිළිබඳ තොරතුරු CIGAS යෙදවුමට ඇතුලත් කිරීමට කාලය සීමා සහිත විය. 2024 වර්ෂයේ සිට මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තොරතුරු CIGAS වැඩසටහන්ට ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු මේ වනවිට සිදු කරමින් පවතී. | මූල්‍ය නොවන වත්කම් වාර්තාව (SA 82) මූල්‍ය ප්‍රකාශනයට අමුණා ඉදිරිපත් කළ යුතු වේ. |

## 3. යහපාලනය

### 3.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව මහජනයාගේ අවශ්‍යතාවය හා ආයතනය පිළිබඳ චෝදනා හෝ ප්‍රසංශා පළකිරීමට නිල වෙබ් අඩවියක් මගින් පහසුකම් සලසා තිබිය යුතු වුවත් අධිකාරය ඒ අනුව කටයුතු කර නොතිබුණි. | දැනට වෙබ් අඩවිය නිර්මාණය කිරීමේ මුලික කටයුතු සිදුකර ඇත. අවශ්‍ය තොරතුරු දත්ත වෙබ් අඩවියට ඇතුළත් කිරීමේ කටයුතු මේ දිනවල සිදු කරමින් පවතී. | මහජනයාගේ අවශ්‍යතාවය හා ආයතනය පිළිබඳ චෝදනා හෝ ප්‍රසංශා පළකිරීමට නිල වෙබ් අඩවියක් මගින් පහසුකම් සලසා තිබිය යුතු වේ. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 32 ක් වුවද තත්‍ය කාර්ය මණ්ඩලය 21 ක් වූ හෙයින් කාර්ය මණ්ඩලයේ 11 ක පුරප්පාඩු පැවතුණි.ඉන් තනතුරු 04 ක පුරප්පාඩු කාල සීමාව වසර 01 සිට වසර 05 දක්වා කාල පරාසයක් ගෙන තිබුණද ඒ සඳහා ස්ථිර නිලධාරීන් පත් නොකර කොන්ත්‍රාත් පදනම මත විශ්‍රාමික නිලධාරීන් සේවයේ යොදවා තිබුණි. | බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කරවා ගැනීමෙන් පසු පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ. | අත්‍යවශ්‍ය තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු වේ. |
| (ආ) | අධිකාරය පිහිටුවා වසර 21 කට අධික කාලයක් ගත වී තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එක් එක් තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටි සකස් කර නොතිබුණි. | බඳවා ගැනීම් පරිපාටිය කඩිනමින් සකස් කරමින් පවතී. | බඳවා ගැනීමේ පරිපාටි අනුමත කරවාගෙන අවශ්‍ය තනතුරුවල බඳවාගැනීම් සිදු කළ යුතු වේ. |
| (ඇ) | 2018 පෙබරවාරි 20 දිනැති අංක 03/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2(iv) ඡේදය ප්‍රකාරව මොනම හේතුවක් නිසා හෝ වයස අවුරුදු 67 සම්පූර්ණකළ කිසිවෙකු රාජ්‍ය සේවයේ අනුමත තනතුරකට පත්නොකළ යුතු වුවත් අවුරුදු 67 ඉක්මවූ විශ්‍රාමික නිලධාරීන් 04 කු අධිකාරයේ අනුමත තනතුරු 04 ක සේවයේ නියුක්තව පැවතුණි. | අධිකාරයේ අනුමත සේවක සංඛ්‍යාව බඳවා ගැනීමට නොහැකිවීම මත හා රාජකාරි අඛණ්ඩව පවත්වාගෙන යාමේ දැඩි අවශ්‍යතාවය මත උපරිම සේවයක් ලබා ගැනිම සඳහා පළපුරුදු නිලධාරීන් සංඛ්‍යාවක් අධිකරණ සේවා කොමිෂන් සභාව එකඟතාවය මත බඳවාගෙන ඇති අතර අලුතින් බඳවා නොගැනීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය මත පෙර සිටි නිලධාරීන්ගේ සේවය දීර්ඝ කිරීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරවමානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කලයුතු වුවත්අධිකාරය විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | අධිකරණ කටයුතු පවත්වාගෙන යාමේ දැඩි අවශ්‍යතාවය මත සේවකයන් පුහුණුව සඳහා යොමු කිරීමේ හැකියාවක් නොමැති හෙයින් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීම ප්‍රායෝගික නොවන බව සඳහන් කරනු කැමැත්තෙමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |